218

# සිංහල නර්තන කලාවේ පහතරට සින්දු වන්නම් පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්. බී.ඒ. විතාරණ
අශා/උ/දප/91/43

කැලණිය විශ්වවිද්‍යාලයේ ලලිතකලා අධ්‍යයනාංශයේ
දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන
පර්යේෂණාත්මක නිබන්ධය

1999

## හැඳින්වීම

සිංහල නර්තන කලාවේ වන්නම්වලට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. මුල දී ගායනය සඳහා ද පසුව නර්තනය සඳහා ද නිර්මාණය වූ වන්නම්-වල ඉතිහාසය මහනුවර යුගය දක්වා දිවෙන්නකි. වන්නම් උඩරට, පහතරට සබරගමු ආදි නර්තන සම්ප්‍රදාය ත්‍රයට ම පොදු වූ නර්තන විශේෂයකි.

දහඅට වන්නම් නමින් ප්‍රචලිත වන්නම් දහඅට උඩරට නර්තන සම්ප්‍රදායට අයත් වන්නකි. එසේ වුව ද සබරගමු හා පහතරට නර්තන සම්ප්‍රදායන් හා බැඳි වන්නම් රාශියක් පවතී. මෙම වන්නම් උඩරට වන්නම් මෙන් ප්‍රචලිත වී නොමැත. පහතරට නර්තන සම්ප්‍රදායට අයත් වන්නම් තිස් දෙකක් ඇති අතර එම වන්නම් හැඳින්වෙන්නේ සින්දු වන්නම් යන සුවිශේෂ නාමයකිනි.

සාහිත්‍ය හා සංස්කෘතික වශයෙන් විශේෂ වටිනාකමක් ඇති මෙම සින්දු වන්නම් දිනෙන් දින ම අභාවයට යමින් පවතින නර්තන විශේෂයක් බවට පත්ව තිබේ. මෙම වන්නම් තිස්දෙක සපයා ගැනීම පවා වර්තමානයේ දුෂ්කර කටයුත්තක් ව තිබේ. මේ අතරින් අද්‍යතන ව්‍යවහාරයේ පවතින්නේ වන්නම් හත අටක් පමණි.

මෙම වන්නම් සියල්ල ම ගායනය කරමින් නර්තනය කළ හැකි ශිල්පීන් ද වර්තමානයේ සොයා ගැනීම අසීරුය. එසේ ම පාරම්පරික නර්තන ශිල්පීන් මෙම වන්නම් නර්තනය කරන අවස්ථා ද විරලය.

සින්දු වන්නම් හත අටක් හෝ අද ශේෂ වී ඇත්තේ පාසල් හා විශ්වවිද්‍යාලවල විෂය නිර්දේශයට සුළු වශයෙන් හෝ ඇතුළත්වීම නිසාය. කරුණු එසේ වුව ද සින්දු වන්නම් පිළිබඳ ව නර්තන ශිල්පීන්ගේ හෝ

නර්තන ක්ෂේත්‍රයේ පර්යේෂකයින්ගේ අවධානය මෙතෙක් යොමු වී ඇති බව ද නොපෙනේ.

සින්දු වන්නම් වලට අත්වී ඇති මේ කණගාටුදායක ඉරණම කරණ කොටගෙන මා සිත් හි සින්දු වන්නම් අරභයා පර්යේෂණයක් කිරීමේ අභිප්‍රායක් ඇතිවිණ.

භාෂාව, විරිත් ලක්ෂණ, තාල ක්‍රම අතින් උසස් සාහිත්‍යාත්මක වටිනාකමක් ඇති මේ සින්දු වන්නම් අප අතරින් අභාවයට යෑමට පෙර ඒ පිළිබඳ ව පර්යේෂණාත්මක ව අධ්‍යයනය කරමින් තත් විෂය මතු පරපුර වෙත විධිමත් ව සංරක්ෂණයකොට තැබීමත් මෙම විෂය පිළිබඳ ව හදාරන්නන් හා පර්යේෂකයින්ගේ අවධානය යොමු කිරීමත් මේ පර්යේෂණයේ අරමුණය.

සිංහල නර්තන කලාවේ පහතරට සින්දු වන්නම් මැයෙන් ඉදිරිපත් කෙරෙන මෙම පර්යේෂණාත්මක නිබන්ධනයෙන් පළමු ව සිංහල නර්තන කලා හා වන්නම් පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කර ඇති අතර සින්දු වන්නම් යන්නෙහි වචනාර්ථය පිළිබඳ ව වැඩි දුරටත් විමර්ශනය කර ඇත. මෙහි දී පළමු ව ඒ පිළිබඳ ව ඉදිරිපත් කර ඇති විද්වත් මතවාද සැලකිල්ලට භාජනය කළ අතර අනතුරු ව වන්නම් හා සින්දු යන්නෙහි වචනාර්ථ පිළිබඳ ව ඉදිරිපත් කර ඇති නිර්වචන ද විමර්ශනයට ලක්කර අවසානයේ පහතරට වන්නම්වලට පමණක් 'සින්දු' යන සුවිශේෂ නාමය භාවිත කිරීමට බලපෑ හේතු ඉදිරිපත් කොට ඇත.

දෙවන පරිච්ඡේදයෙන් සින්දු වන්නම්වල ඓතිහාසික පසුබිම හැකිතාක් දුරට විමර්ශනයට ලක්කර තිබේ. මේ පිළිබඳ ව මෙතෙක් පළවී ඇති විද්වත් මතවාද විමර්ශනයට ලක්කිරීමෙන් අනතුරු ව සින්දු වන්නම්වල ඉතිහාසය පිළිබඳ ව ස්වාධීන මතයක් ගොඩනගා තිබේ. එහි ඇති භාෂා

අලංකාර කාව්‍ය ලක්ෂණ අනුව එය පශ්චාත් මහනුවර යුගයට අයත් සාහිත්‍යාංගයක් විය හැකි බැව් මෙහි දී සාධක සහිත ව ඉදිරිපත්කොට ඇත.

තුන්වන පරිච්ඡේදයෙන් විමර්ශනය කෙරෙනුයේ සින්දු වන්නම්වල අර්ථය හා විරිත් ලක්ෂණ පිළිබඳ ව ය. මෙහි දී එක් එක් වන්නම්වල අර්ථය සරල බසින් ඉදිරිපත් කෙරෙන අතර ඒ ඒ වන්නම්වල දක්වා ඇති විරිත් හා වන්නම් වලින් ධ්වනිත වන විරිත් ලක්ෂණ පිළිබඳ ව පර්යේෂණාත්මක කරුණු ඉදිරිපත්කොට තිබේ.

අවසාන පරිච්ඡේදය වෙන්වන්නේ සින්දු වන්නම් ප්‍රස්තාර කිරීම සඳහාය. එක් එක් වන්නම්වල බෙරපද, තානම, සින්දුවෙහි මාත්‍රා වින්‍යාසය යති නියමය ආදී කරුණු සැලකිල්ලට ගෙන මෙම වන්නම් - ගායනය කළහැකි කිසියම් තාලයක් අනුව ප්‍රස්තාරකොට තිබේ.

– xxxxxxxxxxxx –